

එල්.එච්. මෙත්තානන්ද

# අනුන් වෙනුවෙන් මුළු ජීවිතයම කැප කළ මානව හිතවාදියා

# එල්.එච්. මෙත්තානන්ද

අමර සමර



අමර හේවාමද්දුම

හිටි හැටියේම පාසල් දිනෙක කොළඹ ආනන්ද විද්‍යාලය ඉදිරිපිට මෝටර් රථයක් නතර කෙරිණි. ඒ 1945 වසරයි. ජාතික ඇඳුම ඇඳගත් හීන්දෑරි, උස, සරල චාම් පෙනුමෙන් යුත් පුද්ගලයෙක් ඉන් බැස ගත්තේය. ඔහු කෙළින්ම විදුහල්පති කාමරය දෙසට ඇවිදගොස් ඒ ඇතුළට රිංගා ගත්තේය.

එදින රැස්වීම් පැවැත්වෙන දවසක් නොවූවත් හෝරා කීපයකින් සියලුම සිසුන්ට මහා රැස්වීමකට කැඳවීමක් ලැබිණි. ඒ විවිධ වාද භේද හේතුවෙන් කොළඹ ආනන්ද විද්‍යාලය පිරිහීමට ලක්වෙමින් තිබූ කාලයකි. විද්‍යාලයේ සිසුන්, ගුරුවරු හා දෙමාපියන් පිල් බෙදී කල්ලි ගැසී සිටියහ.

ලොකුසතු හේවගේ මෙත්තානන්ද අම්බලන්ගොඩ කළුමඩුමුල්ලේ දී උපන්නේය. වර්ෂ 1894 මාර්තු 19 වැනිදාවක ය. කඩිමුඩියේ විදුහල්පති කාමරයට රිංගාගත්තේ ඔහුය.

කලහකාරී දඩබ්බර සිසු රැලක් ඉදිරිපිට සිටගත් මෙත්තානන්ද සිසුන් අමතන්නට පටන් ගත්තේය. ලාවට පටන්ගත් හූවකින් සභාව සංගීතවත් විය. කොහේදෝ සිට පියඹා ආ කෙසෙල් ලෙල්ලක් මෙත්තානන්දගේ හිසට උඩින් ඉගිල ගියේය. ඒ වන විට මෙත්තානන්ද පැමිණි මෝටර් රථය ද හොඳ පදමට ගල් මුල් සංග්‍රහයක් භුක්ති විඳ තිබුණි.

දැන් සභාව විකට සැණකෙළියක් බඳුය. සිසුන්ගෙන් නිශ්ශබ්ද වන ලෙස ඉල්ලූ මෙත්තානන්ද සිය කතාව නොනවත්වා කරගෙන යයි. බොහෝ දෙනකු නිහඬ වූ අතර ඇතැමෙකු දිගින් දිගටම බාධා කළහ.

"මම ආවේ ආනන්ද විද්‍යාලය හදන්න මිසක් ආපසු පැරදිලා යන්න නෙවේ. ඒ නිසා මෙතෙක් තිබූ වාද-භේද දුරලා එකාවන්ව වැඩ කරන්නට පටන් ගනිමු" යි කියමින් මෙත්තානන්ද එදා සිට ආනන්ද විදුහල්පති තනතුරේ වැඩ පටන් ගත්තේය. නොහික්මුණු සිසුන් දමනය කිරීටම උපන් ගෙයි හපනෙකු වූ අලුත් මුල් ගුරුතුමාට සියලු දෙනාගේ සහයෝගය ගලා එන්නට වැඩි කල් නොගියේය.

උඩරට ඉතා ධනවත් වෙළෙඳ ව්‍යාපාරිකයකු වූ ලොකුසතු හේවගේ තෝමස් ද සිල්වා හා වීරසූරිය කරලිනාහාමි මෙත්තානන්දගේ මාපියෝ වූහ. පුතුන් පස් දෙනෙක්ගෙන් හා දියණියකගෙන් යුත් පවුලේ පළමු දරුවා මෙත්තානන්ද විය.

> අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ මුලකුරු කියවූ මෙත්තානන්ද ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙන් ඉහළ අධ්‍යාපනය ලැබුවේය. රජයේ ගුරු විද්‍යාලයට ඇතුළත්ව ඉංග්‍රීසි පුහුණු ගුරුවරයකු බවට පත් වූයේ ඉනික්බිතිවය. 1915 වසර වනවිට ලංකාව සිංහල-මුස්ලිම් අරගලයක පෙර නිමිති පහළ කරන අවධියේ හේ යුද හමුදාවේ ස්වේච්ඡා බළකායට බැඳුණේය.

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ මුලකුරු කියවූ මෙත්තානන්ද ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙන් ඉහළ අධ්‍යාපනය ලැබුවේය. රජයේ ගුරු විද්‍යාලයට ඇතුළත්ව ඉංග්‍රීසි පුහුණු ගුරුවරයකු බවට පත් වූයේ ඉනික්බිතිවය. 1915 වසර වනවිට ලංකාව සිංහල-මුස්ලිම් අරගලයක පෙර නිමිති පහළ කරන අවධියේ හේ යුද හමුදාවේ ස්වේච්ඡා බළකායට බැඳුණේය.

මේ වන විට මෙත්තානන්ද වයස විසි එකක හැඳුණු වැඩුණු තරුණයෙකි. හමුදා සේවයේ වසර කීපයක් ගෙවා දැමූ තරුණ මෙත්තානන්දට පෙළවාසියක් කර ගන්නට සිතක් ඇති වූයේ මේ සුනංගුවේ ය.

හෙළ සිරිතට මඟුල් කා කැන්දන් ආ අම්බලන්ගොඩ පෝරඹ වික්‍රමසූරිය වලව්වේ ශීලා වික්‍රමසූරිය මෙත්තානන්දගේ මනාලිය වූවාය. විවාහ වන විට මෙත්තානන්ද හමුදා සේවයෙන් ඉවත්ව සිටියේය.

කවදත් උගැන්මට මෙන්ම ඉගෙන ගැනිල්ලට ද රුචි මෙත්තානන්ද ලන්ඩන් විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙකි. විවාහයෙන් පසු 1930 වසරේ පශ්චාත් උපාධිය දිනා ගන්නට බිරිඳ හා යළිත් එංගලන්තය බලා යන්නට ඔහු මෙහෙයැවූයේ ඒ ආසාවය. යන එන තැන හැකි උපරිම හැකියාව විදහා පාන මෙත්තානන්ද අධ්‍යාපන ඩිප්ලෝමා විභාගය හා අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය දිනා ගත්තේය.

අධ්‍යාපනය ලබන අතර වාරයේ ලැබෙන අස්වැසිල්ලක ජර්මනිය, ප්‍රංශය, ස්විට්සර්ලන්තය ඇතුළු බොහෝ යුරෝපීය රටවල සංචාරය කරන්නට ද මෙත්තානන්ද යුවළට එහි දී හැකිවිය. ඔවුන් පුතුන් තිදෙනෙක් හා දියණියක් ද ලදහ.

මෙත්තානන්ද මහතා ලතින්, ඉංග්‍රීසි, ග්‍රීක් වැනි අපරදිග භාෂාවන් හා ගණිතය, විද්‍යාව වැනි විෂයයන් ප්‍රගුණ කළ අයෙකි. නමුත් ආගම පිළිබඳ ඔහුට හසළ දැනුමක් විය. ඔහුගේ දිවියේ සෑම අංගයක් කෙරේම අගම බොහෝ සේ ඉවහල් විය. පශ්චාත් උපාධිය හදාරා පෙරළා ලංකාවට පැමිණි මෙත්තානන්ද මහතා ටික කලක් ආනන්ද විද්‍යාලයේ වැඩ බලන විදුහල්පතිවරයකු ලෙස කටයුතු කළේය.

1936 වසර වන විට ඔහුට මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති තනතුර භාරගන්නට වූයෙන් එහි ගිය මෙත්තානන්ද මහතා නව වසරක් පුරා එහි රැඳී සිටියේය. ගෙවුණු කාලය තුළ මධ්‍යම පළාතේ උසස්ම බාලක පාසලක් බවට ධර්මරාජය පත් කිරීමට ඔහුට හැකි වූ අතර ඒ සෑම විටෙකම බුද්ධ දර්ශනය පෙරදැරි කර ගැනීමට ද හේ අමතක නොකළේය.


මේ කාලයේ දී මෙත්තානන්ද මහතා සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ යාවජීව සාමාජිකයෙකු ලෙස කටයුතු කරමින් සිටියේය. 1934 දී ගාල්ලේ පැවැත්වුණු සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ 16 වන සමුළුව අවස්ථාවේ සභාපති ලෙස මෙත්තානන්ද මහතා පත් කර ගන්නා ලදී.

ආගමික හා සමාජ සේවා කටයුතුවලදී පසු කලෙක ජාතික මට්ටමින් පුරෝගාමීව නායකත්වය ගෙන ක්‍රියා කිරීමට තරුණ මෙත්තානන්ද පන්නරය ලැබුවේ එහි දී ය. 1930 දශකයේ සබරගමුව වසා පැතිරුණු මැලේරියාව වසංගතයෙන් බොහෝ ජනයා පීඩා වින්දෝය. සමාජ සේවා කටයුතුවල නිරත ව සිටි මෙත්තානන්ද වඩ වඩාත් ජනයා වෙත සමීප කරවීමට ආසන්නතම හේතුවක් වූයේ මැලේරියා වසංගතයයි.

මැලේරියා රෝගයෙන් අසරණව පීඩා විඳින වතු කම්කරුවන් ඇතුළු ජනයා සොයා කෑගලු දිස්ත්‍රික්කය පීරා ඇවිද ගිය මෙත්තානන්ද මහතා ඇන්.ඇම්. පෙරේරා, කොල්වින්, එස්.ඒ. වික්‍රමසිංහ වැනි නායකයින් පමණක් නොව සෑම ආගමික නායකයකු සමගම එහි දී මූලිකත්වය ගෙන කටයුතු කළේය.




මෙත්තානන්ද මහතා විවාහ වීමෙන් අනතුරුව විදේශ සංචාරයකදී



මෙත්තානන්ද යුවළ දූ දරුවන් සමග



මෙත්තානන්ද මහතා විවාහ දිවියට පිවිසි දින



අසරණ සරණ සේවයේ දී ඔහුට රැයක් දවාලක් නොතිබුණි. එකල කෑගල්ල දිස්ත්‍රික්කයේ උප ඒජන්තවරයාව සිටි බ්‍රිතාන්‍ය ජාතික සිවිල් නිලධාරී එෆ්.සී. ජිම්සන්ගේ වාර්තාවක මෙත්තානන්ද මහතා පිළිබඳ මෙසේ ලියැවී තිබුණි.

"විදුහල්පතිවරයෙක් ලෙස කටයුතු කරමින් සිටින අතර තුර ඉතාම දුෂ්කර ගම්වලට පයින් ඇවිද ගිහිං මෙත්තානන්ද කළ සේවය පිළිබඳ සිතාගන්නටවත් නොහැක" යනුවෙනි ඒ.

එසේම මෙම පීඩාකාරී අවස්ථාවේ කෑගලු දිස්ත්‍රික්කයේ ගම්මානවල ඇති වූ දරුණු ප්‍රශ්නයන්හි දී එය විසඳීමට ඉඩ ලබා දුන්නේ ද මෙත්තානන්දට බව ජිම්සන් පවසා ඇත.

මේ අතර 1945 වර්ෂය වන විට මෙත්තානන්ද මහතාට ධර්මරාජ විද්‍යාලයෙන් සමුගෙන කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පති තනතුරේ වැඩ බැලීමට නියමිතව තිබුණි. පිරිහීමට ලක්වෙමින් තිබූ ආනන්දයට ආනන්දයක්ව මෙත්තානන්ද මහතා පැමිණියේ ඒ වකවානුවේ දී ය.

වෙහෙස නොබලා, අව්වැසි නොතකා, දිවා රෑ නොසිතා මහත් පරිශ්‍රමයෙන් කටයුතු කළ මෙත්තානන්ද මහතාට ආනන්ද විද්‍යාලයේ ඔද්දල් වූ පරිපාලන කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට වැඩි කල් ගත නොවුණි. දැනුදු ආනන්දයේ දක්නට ලැබෙන බොහෝ ගොඩනැගිලි එදා මෙත්තානන්ද මුල් ගුරුතුමාගේ පරිශ්‍රමයේ ප්‍රතිඵලයන් ය.

වසර ගණනාවක් සේවය කර ආනන්දයෙන් විශ්‍රාම ගෙන පිටව යන විට මෙත්තානන්ද මහතාට වයස අවුරුදු හැටත් සම්පූර්ණව තිබිණි. එතැන් සිට ඔහුගේ ජීවිතයේ ඉතාමත් වැදගත්ම සේවය සඳහා ඇප කැප වන්නට තරම් මෙත්තානන්ද මහතා භාග්‍යවන්තයෙක් වූවේය.

ලංකාවේ අග්‍රගණ්‍ය පැවිදි නායකයන් හා මලලසේකර, කුලරත්න වැනි ගිහියන් සමග බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාවට සම්බන්ධව කටයුතු කරන්නට ලැබීම ඔහු ලද වාසනාවකි. එහි දී හේ ලංකාව පුරා ගමක් ගමක් පාසා ගොස් අපමණ දුක් ගැහැට විඳින බෞද්ධයින්ගේ තොරතුරු විමසුවේය.

බුද්ධ ශාසනයට අත් වී ඇති බේදජනක ඉරණම හා එය පරිහානියට පත් වන අන්දම පිළිබඳ වාර්තාවක් සකස් කිරීමට දායක වූ විද්වතුන්ගෙන් මෙත්තානන්ද මහතාට අද්විතීය ස්ථානයක් හිමිවේ.

ඒ අනුව එළැඹුණු 1956 වසරේ නිදහස් දිනයේ කොළඹ ආනන්දවිද්‍යාලය අතිවිශාල ජනකායකින්ගැවසී තිබුණි. ගිහි පැවිදි දෙනෝදාහක් ඉදිරියේ එම බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාවේ වාර්තාව මහජනයාට හෙළිකරන්නට ලැබීම ඔහුගේ ජීවිතයේ දෛවෝපගත සිදුවීමක් විය. සිංහල බෞද්ධ ජනයා අතර මේ වන විට මෙත්තානන්ද යන්න ගරු බුහුමනින් පුද ලද නාමයක් බවට පත්ව තිබුණි.

ඉන් ලැබූ ධෛර්යය එතුමාට පසු කලෙක බෞද්ධ ජාතික බලවේගය ගොඩ නැංවීමට පසුබිම සකස් කර දුනි. ධර්ම සමාජය නමින් සංවිධානගතව "බෞද්ධ පෙරමුණ" නම් පුවත්පතක් පළකිරීමට එහි දී මෙත්තානන්ද මහතාට හැකිවිය. ඔහු ඉතාම දක්ෂ නායකත්වයකින් මෙන්ම සංවිධාන ශක්තියෙන් අනූන වූවෙකි. ඉතාමත් ආදර්ශවත් චරිතයක් වූ ඔහුට තියුණු දැක්මක් තිබුණි.

කලක පටන් බෞද්ධයින් හට වන අසාධාරණකම් පිළිබඳ ලොවට හෙළි කිරීමට පුවත්පත් කොමිසමක් පත් කළ යුතු යැයි තරයේම රජයට බල කිරීමට මුල් වූයේ ද මෙත්තානන්ද මහතා ය.

ඊනියා ජාතික පුවත්පත් හරහා රටට, සිංහල ජාතියට, බෞද්ධයිනට සිදුවන කුඩම්මාගේ සැලකිලි පිළිබඳ ඉන් හෙළිදරව් කිරීමට එමගින් හැකි විය. මෙත්තානන්ද මහතා ගැඹුරු දේශපාලන දෘෂ්ටියකින් යුතු වූවෙකි.


1956 බණ්ඩාරනායක මහතා බලයට පත් කිරීමට ගම් දනව් සිසාරා සංවිධාන කටයුතුවලට උරදුන් ඔහු පසු ලාභ ප්‍රයෝජන තඹයකට හෝ මායිම් නොකළෙකි. බලයට පත් වූ බණ්ඩාරනායක මහතා විදේශ තානාපති තනතුරකින් මෙත්තානන්ද මහතා සතුටු කිරීමට උත්සාහ කළ අවස්ථාවේ හේ එය නිහතමානීව ප්‍රතික්ෂේප කළේය.

පදවි තානාන්තරයන්ට වඩා උතුම් වූ බුද්ධ ශාසනයත්, සිංහල බෞද්ධ ජාතියත් වසර සිය ගණනක් පුරා විඳි දුක් ගැහැටින් මුදවා ගන්නා ලෙස කළ ඉල්ලීම ඔහුගේ එකම ඉල්ලීම ද විය.

වසර 73ක දිවි ගමනක් කෙළවර කරමින් 1967 නොවැම්බර් පළමුවැනි දා මෙත්තානන්ද මහතා මිය යන විට ඔහුගේ සේවය රටට හා ජාතියට නැතුවම බැරි එකක් බවට පත්ව තිබිණි.

සිය දහසක් සිසු නැණ පාදමින්, සිය දහසක් අසරණ ජනයාට සෙත සලසමින්, බෞද්ධ ප්‍රබෝධයේ පහන් එළි දැල්වූ මෙත්තානන්ද මහතා තුළ පැවති නායකත්වයේ ලක්ෂණ සැබවින්ම ප්‍රශංසනීය ය. ඉනිදු ඉක්මවා ඔහු තුළින් ගලා ගිය සැබෑ මානව හිතවාදීත්වය එදාටත් වඩා අවැසියේ අදට ය. සත්‍යය නම් එය, හෙටට ඊටත් වඩා අවශ්‍ය වීමය.

සකස් කළේ-
මනෝරි කළුගම්පිටිය



University of Cambridge

THIS is to make known that

[illegible] H. Mettananda

is a STUDENT CERTIFICATED by the UNIVERSITY of CAMBRIDGE, having passed the Examination for SENIOR Students held by the Syndicate appointed to conduct the Examination of Students not members of the University.

Date of Examination, Dec 1911 Index-number, [illegible]

Age, 17 Centre, Galle

The above-named Student satisfied the Examiners in ARITHMETIC, and in the [illegible] following sections or parts of sections:

1. RELIGIOUS KNOWLEDGE;
2. ENGLISH LANGUAGE AND LITERATURE (including COMPOSITION);
3. History and Geography
4. Latin
5. Geometry and Algebra
6. Book-keeping

R. F. Scott
VICE-CHANCELLOR

කේම්බ්‍රිජ් උපාධි සහතිකය